ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகரிஸ் வீதி, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

දුරකථන / தொலைபேசி / Fax : 684091
ඊමේල් / மின்னஞ்சல் / E-mail : Landcom@sltnet.lk


26

මගේ අංකය / எனது இல / MY NO : 4/10/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO :
දිනය / திகதி / DATE : 2003.03.20

චක්‍රලේඛ අංක.04 - 2003

සියළුම ප්‍රාදේශිය ලේකම් වරුන් වෙත.

## <u>රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගැනීම හා නිතිවිරෝධි ඉදිකිරීම්</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් අමිතා ඇති රාජ්‍ය ආරක්ෂක ලේකම්ගේ 2003.03.04 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමු කරනු කැමැත්තෙමි.(ලිපියෙහි පිටපතක් අමුණා ඇත).

නිති විරෝධි ආකාරයෙන් රජය සතු ඉඩම් අල්ලාගැනිමටත් එමගින් අල්ලාගනු ලබන ඉඩම් වල ජනාවාස ඇතිකිරිමටත් විවිධ ආකාරයේ ඉදිකිරිම් කරනු ලබන බවටත්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත වාර්තාවි ඇත. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් පරිපාලන නිලධාරින්ගෙන් විධිමත් අවසරයක් නොලබා පුරාවිද්‍යාත්මක වටිනාකම් ඇති ඉඩම් වල ආගමික සිද්ධස්ථාන ඉදිකිරිම්ද මේ අතර වාර්තා වේ. එසේම මෙවැනි ආගමික සිද්ධස්ථාන ආගම් නාමයෙන් ඉදිකර තවදුරටත් ව්‍යාප්ත කිරිම මගින් අනෙකුත් ආගම් වල සාමාන්‍ය ජනයා මහත් අපහසුතාවයන්ට පත්වි ඇති බව ද වාර්තා වි ඇත. මෙවැනි කරුණු මගින් වර්තමාන සාම ක්‍රියා දාමයටද බාධා පැමිණ ඇති අතර, සාම සාකච්ඡාවලදි රජයටත් එල්ටිටිර සංවිධානයටත් ඉතා අසිරු තත්වයන්ට මුහුණ දිමට සිදුව ඇත. එසේම මෙවැනි කටයුතු ජාතින් දෙකෙන්ම සිදුවන බවද වාර්තා අනුව පෙනි යයි.

ඉහත තත්ත්වය යටතේ ඔබ බල ප්‍රදේශය තුල ඇති කිසිදු රජයේ ඉඩමක විධිමත් අවසරයක් නොලබා කිසිවකුට හෝ වගා කිරිම,පදිංචි විම හෝ ආගමික සිද්ධස්ථාන ඉදිකිරිම සඳහා ඉඩ නොදිමට වහාම පියවර ගතයුතුය. මේ සම්බන්ධයෙන් ඔබගේ සියළුම ක්ෂේත්‍ර නිළධාරින් වහා කැඳවා අවශ්‍ය උපදෙස් දිමට පියවර ගන්න. එම ක්ෂේත්‍ර නිලධාරින්ගේ බල ප්‍රදේශ වල එවැනි අනවසර අල්ලා ගැනිමක් සිදුවන්නේ නම් එය වහාම නැවැත්විමටත්, ඔහුගේ බලතල සිමාවන් තුළ එසේ නැවැත්විමට අපහසුවන්නේ නම් වහාම එය ඔබ වෙතට වාර්තා කරන ලෙසටද උපදෙස් දෙන්න. එසේ වාර්තාවූ වහාට රජයේ ඉඩම්(සන්තකය ආපසු ලබාගැනිමේ) පනත යටතේ අනවසර කරුවන් ඉවත් කිරිමට පියවර ගන්න. අවශ්‍යවන්නේ නම් පොලිසියේ සහාය ලබා ගැනිමටද ක්‍රියා කරන්න.

මෙය වර්තමානයේ ජාතික වැදගත් කමකින් යුක්ත ප්‍රශ්නයක් බවට පත්ව ඇ
හෙයින් ඔබගේ දැඩි අවධානය මේ සම්බන්ධයෙන් යොමු කල යුතු බව අවධාරණය කරු
කැමැත්තෙමි. තවදුරටත් ඉහතකී සිද්ධීන් ඔබ බලප්‍රදේශය තුලින් වාර්තා වන්නේ නම් ඒ
වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් රජයට දැඩි ක්‍රියාමාර්ගයක් ගැනීමට සිදුවන බව
තවදුරටත් අවධාරණය කරමි. මෙම චක්‍රලේඛය ලද බව මා වෙත දන්වා එවන්න.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස්.

පිටපත්.

1 අග්‍රාමාත්‍ය ලේකම්,
2 ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
3 ලේකම්, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.
4 ලේකම්, මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
5 ලේකම්, හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය
6 ප්‍රධාන ලේකම් වරු.
7 සියළුම දිසාපති වරුන් - මේ සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට,
8 පළාත් ඉඩම් කොමසාරිස් වරුන්, - මේ සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට
9 නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වරුන්, - මේ සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට